University of Colombo
Faculty of Arts
Computer Teaching Unit
Third Year Examination in Arts – Semester II – 2018
ICT3244 – Project Management
Two Hours
This Question paper consists of four questions
මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් සමන්විත වේ

Answer **only three questions** Total Marks = 60
ප්‍රශ්න **තුනක් සඳහා පමණක්** පිළිතුරු සපයන්න මුළු ලකුණු = 60

1.

i.

a. What is 'Project management'? State a definition to describe. Marks 3

'ව්‍යාපෘති කළමනාකරණය' යනු කුමක්ද?. පැහැදිළි කිරීම සඳහා නිර්වචනයක් සඳහන් කරන්න. ලකුණු 3

b. What are the common characteristics of all the 'Project Management' definitions? Marks 4

සියලු 'ව්‍යාපෘති කළමනාකරණ' නිර්වචනයන්හි පොදු ලක්ෂණ ලියා දක්වන්න. ලකුණු 4

ii. Briefly describe the role of a 'Project Manager'. Marks 5

'ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ' භූමිකාව කෙටියෙන් විස්තර කරන්න. ලකුණු 5

iii. Imagine that you are a Director of an ICT company. You are calling an interview to select a 'Project Manager' for this ICT Company. Prepare the marking scheme for the evaluation process in this interview. Marks 8

ඔබ ICT සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස උපකල්පනය කරන්න. මෙම ICT සමාගමට 'ව්‍යාපෘති කළමනාකරුවෙකු' තෝරා ගැනීම සඳහා ඔබ විසින් සම්මුඛ පරීක්ෂණයක් කැඳවනු ලබයි. මෙම සම්මුඛ පරීක්ෂණයෙහි ඇගයුම් ක්‍රියාවලිය සඳහා ලකුණු ලබාදීමේ පටිපාටිය සකස් කරන්න. ලකුණු 8

2.

i. Draw the 'Project Management Cycle'. Marks 3

'ව්‍යාපෘති කළමනාකරණ චක්‍රය' ඇඳ දක්වන්න. ලකුණු 3

ii.

a. What are the tools and techniques used in pre-initiation phase of 'Project Management' Marks 4

'ව්‍යාපෘති කළමනාකරණයෙහි' පූර්ව ආරම්භක අදියරේදී (pre-initiation phase) භාවිත වන මෙවලම් (tools) හා ශිල්පීය ක්‍රම (techniques) මොනවාද? ලකුණු 4

b. Briefly describe the planning and designing phase of 'Project Management' Marks 5

'ව්‍යාපෘති කළමනාකරණයෙහි' සැළසුම් කිරීමේ (planning) හා නිර්මාණ කිරීමේ (designing) අදියර කෙටියෙන් විස්තර කරන්න. ලකුණු 5

iii. Akarawita is a rural village in the Polonnaruwa District. At the request of the local authority, Mr. Ekanayake a leading businessman in the area is hoping to construct a hotel near an ancient lake. Imagine that you are the 'Project Manager' of this project. Carry out the SWOT analysis for this project. Marks 8

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අකරවිට යනු දුෂ්කර ගම්මානයකි. මෙම ප්‍රදේශයේ ප්‍රමුඛ ව්‍යාපාරිකයෙකු වන ඒකනායක මහතා පළාත් පාලන ආයතනයේ ඉල්ලීම මත ඉපැරණි විලක් ආසන්නයෙහි හෝටලයක් ඉදිකිරීමට බලාපොරොත්තු වෙයි . මෙම ව්‍යාපෘතියේ, 'ව්‍යාපෘති කළමනාකරු' ඔබ යැයි සිතන්න. මෙම ව්‍යාපෘතිය සඳහා SWOT විශ්ලේෂණය සිදුකරන්න. ලකුණු 8

3.

i.

a. What is an 'ICTD Project'? Marks 3

"ICTD ව්‍යාපෘතියක්" යනු කුමක්ද? ලකුණු 3

b. Briefly describe the unique features of an 'ICTD project'. Marks 5

'ICTD ව්‍යාපෘතියක' අනන්‍ය ලක්ෂණ (unique features) කෙටියෙන් විස්තර කරන්න. ලකුණු 5

ii. List four ICT devices used in ICTD projects. Marks 4

ICTD ව්‍යාපෘතියන්හි භාවිත කරන ICT උපකරණ (ICT devices) හතරක් ලැයිස්තුගත කරන්න. ලකුණු 4

iii. Ms. Malithi Senadheera is a 'Project Manager' at "ICTBT" company, which is limited for ICTD projects. A newly established fabric shopping complex requests her to develop an online shopping site for this shopping complex. Explain the "State of Acceptance" of this request. Marks 8

මලිති සේනාධීර මෙනෙවිය, ICTD ව්‍යාපෘති සඳහා සීමා වන "ICTBT" සමාගමක ව්‍යාපෘති කළමනාකාරිනියයි .අලුතින් ආරම්භ කරන ලද රෙදිපිළි සාප්පු සංකීර්ණයක්, සිය සාප්පු සංකීර්ණය උදෙසා online වෙළඳ අඩවියක් (online shopping site ) ස්ථාපිත කරන ලෙස ඇයගෙන් ඉල්ලා සිටී.මෙම ඉල්ලීම "පිළිගැනීමේ තත්වය" පැහැදිලි කරන්න. ලකුණු 8

4.

i. List three 'Project Management' approaches. Marks 3

'ව්‍යාපෘති කළමනාකරණ' ප්‍රවේශ තුනක් ලැයිස්තුගත කරන්න. ලකුණු 3

ii.

a. Draw the 'System Development Life Cycle'. Marks 4

'පද්ධති සංවර්ධන ජීවන චක්‍රය' (System Development Life Cycle) ඇඳ දක්වන්න. ලකුණු 4

b. Briefly describe the testing step of 'System Development Process'. Marks 5

'පද්ධති සංවර්ධන ක්‍රියාවලියේ' පරීක්ෂණ අදියර (testing step) කෙටියෙන් විස්තර කරන්න.

ලකුණු 5

iii. "ICTD Project managers request higher salaries than general project managers. One of the reasons for requesting higher salaries is having to spend more time on the rapid evolution of ICTD due to trends affecting ICTD". Describe this status using trends affecting ICTD. Marks 8

" ICTD ව්‍යාපෘති කළමනාකරුවෝ, සාමාන්‍ය ව්‍යාපෘති කළමනාකරුවන් ට වඩා ඉහළ වැටුප් ප්‍රමාණයක් ඉල්ලා සිටිති. ඉහළ වැටුප් ඉල්ලීම් සඳහා එක් හේතුවක් වන්නේ ICTD හි සීග්‍ර පරිණාමය වෙත බලපාන ප්‍රවණතා හේතුවෙන් ICTD සඳහා වැඩි කාලයක් ගත කිරීමය". ICTD සඳහා බලපාන ප්‍රවණතා භාවිතා කරමින් මෙම තත්වය විස්තර කරන්න. ලකුණු 8